www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සය මසක් සපිරුනු ඔබාමා පරිපාලනය

## Six months of the Obama administration

2009 ජුලි 21

සය මසකට පෙර ඊයේ වැනි දිනයක ඔබාමා එක්සත් ජනපදයේ 44 වන ජනාධිපති වශයෙන් දිවුරුම් දුන්නේය.

ඔබාමා තෝරා පත්කර ගැනීම, බුෂ් පරිපාලනයේ හා එහි දේශීය හා විදේශ පිලිවෙත්, ජනතාව විසින් පිලිකෙව් කිරීම සලකුනු කලේය. "ඔබට විශ්වාසය තැබිය හැකි වෙනස" යන ඔබාමාගේ ප්‍රධාන සටන් පාඨය, අට වසරක යුද්ධය හා ව්‍යාපාරික ප්‍රභූවේ ආසක්තයන් කෙරෙහි පමනක් යොමු වූ අවධානයෙන් හෙම්බත්ව සිටි ජනගහනයේ පිපාසාවට දුන් දිය පොදක් විය.

වෙනසක් සඳහා වූ කම්කරු පන්තියේ ද තරුනයන්ගේ ද පුලුල් කොටසකගේ පිපාසාව, ඔබාමාගේ පුද්ගලිකත්වයෙන් හා පුද්ගල ඉතිහාසයෙන් සංකේතවත් විය. ඔබාමා පලමු අප්‍රිකානු ඇමරිකානු ජනාධිපති වන්නේය යන කාරනය, බොහෝ දෙනෙක් දැක ගත්තේ දුගීන් හා පීඩිතයන් ගැන ඔහු, හදවතින්ම සැලකිලිමත් වනු ඇතැයි විශ්වාස කිරීමට හේතුවක් ලෙස ය. කුමක් සිදු වුවත් ඔවුන් විශ්වාස කලේ, මීට පෙර පැමිනි අයට වඩා ඔහු බෙහෙවින්ම වෙනස් වනු ඇති බවයි.

සය මසක අත්දැකීමෙන් එලඹිය හැකි නිගමනය කුමක් ද? කරුනු කාරනා තමන් වෙනුවෙන් කථා කරයි. කොන්ග්‍රසයේ මන්ඩල දෙකෙහිම සැලකිය යුතු ඩිමොක්‍රටික් බහුතරයක් තිබිය දී එහි සභාපතිත්වය දරන ඔබාමා, සෑම තීරනාත්මක ප්‍රශ්නයක දී ම අනුගමනය කර ඇත්තේ සිය පූර්වගාමියාගේ මූලික පිලිවෙත් ය.

### මිලිටරි පිලිවෙත

පරිපාලනයේ මිලිටරි පිලිවෙතේ දිශානතිය පිලිබඳව කල් තියාම ඇඟවුම් නිකුත්වී තිබුනි. සිය දිවුරුම් දීමෙන් තෙදිනකට පසුව ජනවාරි 23 වන දින පකිස්ථානයේ අභ්‍යන්තර ස්ථානයකට, ස්වයංක්‍රීය ප්‍රිඩේටර් ඩ්‍රෝන්ස් මිසයිල් ප්‍රහාර එල්ල කිරීමට ඔබාමා නියෝග කලේය. මිනිසුන් 18 කට මරු කැඳවූ මෙම ප්‍රහාරයේ ලේ තවරා ගත් ඔබාමා යුහුසුලුව ක්‍රියාත්මක විය.

ඇෆ්ගනිස්ථාන යුද්ධය වනාහි දැන් නිසැක ලෙසම "ඔබාමාගේ යුද්ධයකි." ඔහුගේ නිරීක්ෂනය යටතේ එක්සත් ජනපදය, දැනට දකුනු ප්‍රදේශ වල මහජන විරෝධය අතුගා දැමීමේ ප්‍රධාන ක්‍රියාන්විතයන් සඳහා හමුදා ශක්තිය 32,000 සිට 68,000 දක්වා ඉහල නංවා තිබේ. මේ මාසය තුල මේ දක්වා අඩුම තරමින් එක්සත් ජනපද සෙබලුන් 30 ක් හා නේටෝ භටයන් 25 ක් මිය ගොස් ඇති අතර, ජුලි මාසය ආක්‍රමනික හමුදාවන්ට මරනීය මාසය බවට පත්කර තිබේ.

කෙසේ වෙතත් ඔබාමාට, මෙම මෙහෙයුම "ඇෆ්පැක්" යුද්ධයක් බවට පත්ව තිබේ. පකිස්ථානය තුලට එල්ල කරන මිසයිල් ප්‍රහාර නිරතුරුව ම පාහේ පකිස්ථාන සිවිල් වැසියන් දුසිම් ගනනකට මරු කැඳවන අතර, එය සාමාන්‍ය සිද්ධියක් බවට පත්ව තිබේ. පරිපාලනය, පකිස්ථානයේ වයඹ දිග ප්‍රදේශ තුල ආක්‍රමනය එරට ආන්ඩුව විසින් ම ගෙන යා යුතු යයි බලකරන අතර, එහි ප්‍රතිපල වශයෙන් ලක්ෂ ගනනක් අනාථයන් බවට පත්ව විශාල සංඛ්‍යාවක් මරුමුවට පත්ව ඇත.

ඉරාකයේ මිලිටරි ග්‍රහනය තව දුරටත් පවත්වාගෙන යයි. නගරවලින් එක්සත් ජනපද හමුදා ඉවත්කර ගැනීම රටතුල එක්සත් ජනපදයේ මැදිහත් වීම් වල අවසානයක් සනිටුහන් නොකරයි. නගරවලින් පිටත ස්ථාවර ලෙස ස්ථාන ගත කර ඇතැයි සැලකිය හැකි හමුදාව මිලිටරි කඳවුරු තුල රඳවා ඇති අතර පරිපාලනය, එම හමුදාව "උපදේශකයන්" ලෙස නම් කිරීමේ ක්‍රියාවලියක් අරඹා තිබේ. අඩමාන දේශපාලන තත්ත්වයේ බිඳ වැටීමක් ඇතිවූ අවස්ථාවක එක්සත් ජනපද මිලිටරිය, මුලු බලය යොදා මැදිහත්වනු ඇත.

### ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති

ඔබාමාගේ දේශීය පිලිවෙතෙහි මුලු අවධානයම පාහේ යොමුව ඇත්තේ, වඩාත් බලගතු ව්‍යාපාරික හා මූල්‍ය ප්‍රභූවේ ධනය ආරක්ෂා කිරීමට ය. කිසිදු කොන්දේසියකින් තොරව කෙලින්ම මුදල් එන්නත් කිරීම ද, සහන හා නය වැඩ සටහන් ද මගින් ට්‍රිලියන ගනන් මුදල් බැංකු වලට හා මූල්‍ය ආයතන වලට පිරිනමා ඇත. විධායකයන්ගේ වැටුප් හා ප්‍රතිලාභ වලට

අදාල කිසිදු සැබෑ සීමාකිරීමකට ම පරිපාලනය විරුද්ධ වී තිබේ.

ආන්ඩුවේ ප්‍රධානයන් පාවිච්චියට ගනිමින් ලොකු ම බැංකු 2009 දෙවන කාර්තුවේ දැවැන්ත ලාභ අත් කර ගෙන තිබේ. ගෝල්ඩ්මන් සැක්ස් ඩොලර් බිලියන 3.4 ක් හා ජේපී මෝගන් ස්ටැන්ලි ලබාගත් බිලියන් 2.7 ක් මීට ඇතුලත් ය. සිය විධායකයන් හා ගනුදෙනු කරුවන්ට මේ වසරේ දී වාර්තාගත ප්‍රතිලාභ ගෙවීමට ද බැංකු සැලසුම් කර ඇත.

සිය සමපේක්ෂන හා කොල්ලකෑමේ උපායන් තුලින් ආර්ථික අර්බුදය ජනනය කලා වූ එම ආයතන ම වෙන කවරදාකටත් වඩා සාර්ථක ප්‍රතිපල ලබා ඇත. මෙය අහම්බයක් නොවේ. එය ඔබාමා පරිපාලන විසින් සිතා මතාම ගෙන ගිය ප්‍රතිපත්තියේ ප්‍රතිපලයයි.

බොහෝ මෝටර් රථ කම්කරුවෝ සාධනීය වෙනසක් සඳහා ඔබාමා දෙස බැලූහ. ඒ වෙනුවට සිදුව ඇත්තේ, දස දහස් ගනන් රැකියා විනාශයත් සමඟ දැවැන්ත වැටුප් හා සහන කප්පාදුවක් සඳහා පරිපාලනය බලපෑම් කිරීමයි. දස දහස් සංඛ්‍යාත විශ්‍රාමිකයන්ගේ සෞඛ්‍ය පහසුකම් සඳහා වූ හිමිකම් ද ඇතුලු, තමන්ට බරක්ව තිබූ බිලියන ගනන් වටිනා කමක් සහිත වගකීම් වලින් මිදී යාමට සමාගම් වලට ඉඩ සැලසුන බංකොලොත්භාවය ප්‍රකාශයට පත් කල අධිකරන තීන්දු ලබාගැනීමට, ඔබාමා ජෙනරල් මෝටර්ස් හා ක්‍රයිස්ලර් සමාගම්වලට බල කලේය.

බැංකු වලට සපයන ලද වර්ගයේ නය, ප්‍රාන්ත හා ප්‍රාදේශීය ආන්ඩු වලට ලබාදීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් ද පරිපාලනය අනුගමනය කලේ ඊට සමාන ප්‍රතිපත්තියකි. ආර්ථික බිඳ වැටීමක අද්දර පැවති රටේ විශාලතම ප්‍රාන්තය වන කැලිෆෝනියාවේ අර්බුදය ආන්ඩුව යොදාගත්තේ, අධ්‍යාපනය, සමාජ ශුභසාධන හා අනෙකුත් සමාජ වැඩ සටහන් කපා හැරීම සඳහා සැලසුන මහඟු අවස්ථාවක් ලෙසය. රට පුරාම ඒ හා සමාන කුරිරු පියවර ගනිමින් තිබේ.

ඔබාමාගේ ප්‍රමුඛ දේශීය ආරම්භකත්වය, එනම් සෞඛ්‍ය පහසුකම් "ප්‍රතිසංස්කරන" පිලිබඳව සලකන කල්හි, පරිපාලනයේ යෝජනාවලට තල්ලුව දෙන්නේ, සිය සෞඛ්‍ය පහසුකම් කැපීමේ ව්‍යාපාරික අභිලාෂයන් හා විශේෂයෙන් ම, සෞඛ්‍ය සේවා කර්මාන්තයේ ප්‍රමුඛයන් වන රක්ෂන හා ඖෂධ සමාගම් වල ඉල්ලීම් මගින්ය.

සෞඛ්‍ය පහසුකම් "ප්‍රතිසංස්කරන," සියල්ලන්ට ප්‍රමානවත් පහසුකම් සැලසීම කෙරෙන් වියදම් කැපීම කරා මාරුවී ඇත. අයවැය හිඟය පහත හෙලා ආර්ථිකය යථාවත් කිරීම සඳහා සෞඛ්‍ය සේවා වියදම් කපාහැරීම අත්‍යවශ්‍ය බව අවධාරනය කරන අතර තුර පවා ඔබාමා, බැංකු ගොඩදාගැනීම සඳහා "තමන්ට කල හැකි සියල්ල කරන බව" කියා සිටියි.

අවසානයේ දී සෞඛ්‍ය පහසුකම් පනත සම්මත වුව හොත්, නොසැහෙන සෞඛ්‍ය රක්ෂනය හා පහසුකම් සලාක කිරීම සඳහා කම්කරුවන්ට වැඩිපුර ගෙවීමට සිදුවනු ඇත. මෙම "පුලුල් කල සෞඛ්‍ය ආවරනය," ෆෙඩරල් සෞඛ්‍ය සේවා වැඩ සටහන්, විශේෂයෙන් ම මෙඩි කෙයා, කැපීම සඳහා නිමිත්ත කරගනු ඇත.

අන් සියල්ලක් මෙන්ම සෞඛ්‍ය පහසුකම් ද, පන්ති පදනමක් සහිත ක්‍රමයක් ලෙස වඩාත් විවෘතව ප්‍රතිව්‍යුහගත කෙරෙයි. ධනවතුන්ට මුදලට ගත හැකි හොඳම ප්‍රතිකාර ලැබෙන අතර වාරයේ, තම සෞඛ්‍ය හා අනෙකුත් අවශ්‍යතා අතර තෝරාගැනීමකට කම්කරුවන්ට බලකෙරෙනු ඇත.

ආර්ථික අර්බුදයට මුහුනපෑමේ පරිපාලනයේ ප්‍රතිපත්තිවල ප්‍රතිපලය ධනය දැවැන්ත පරිමානයකින් පහල සිට ඉහලට යලි බෙදා හැරීමකි.

**ප්‍රජාතන්ත්‍රීය අයිතීන්**

අන් සියලු කරුනුවල දී මෙන්ම ඔබාමා පරිපාලනය, සිය පූර්වගාමියාගේ ප්‍රජාතන්ත්‍ර විරෝධී පිලිවෙත් ම තව දුරටත් ඉදිරියට ගෙන යයි. වධ දීම් හා රටතුල ඔත්තු බැලීම් වලට අභියෝග කරන නඩු විභාග වැලැක්වීම සඳහා එය, "රාජ්‍ය රහස්" පිලිබඳ ප්‍රශ්නය යොදා ගනියි. එක්සත් ජනපදය විසින් රැඳවියන්ට වධ හිංසා පැමිනවීමට අදාල ඡායාරූප ප්‍රසිද්ධියට පත්කිරීම පිලිබඳ එහි පොරෙන්දු, පරිපාලනය විසින් දැන් ආපසු කරකවා ඇත. එය තව දුරටත් මිලිටරි නඩු විභාග පවත්වාගෙන යන අතර දින නියමයකින් තොරව ගුවන්තනාමෝ බේ හි රඳවා තැබීමේ ප්‍රතිපත්තියක සැලසුම් පිලිබඳව ද ඇඟවුම් කර තිබේ.

බුෂ් පරිපාලනය විසින් සිදුකර ඇති කිසිදු අපරාධයකට දඬුවම් පැමිනවීමක් සිදු නොවනු ඇතැයි ඔබාමා යලි යලිත් අවධාරනය කොට තිබේ. එහි අර්ථය, කිසිවෙකුත් වගකීමට බැඳී නොමැති බවත් අපරාධ තව දුරටත් කෙරීගෙන යන බවත් ය.

2008 මැතිවරනයේ ප්‍රතිපලය, ඇමරිකානු ප්‍රජාතන්ත්‍රවාදයේ බිඳවැටීම පිලිබඳ වෛෂයික පාඩමකි. මෙම මැතිවරනය, ජයග්‍රාහකයා වෙනුවෙන් ඡන්දය පාවිච්චි කල ඡන්දදායකයන්ගේ කැමැත්තට අත්‍යන්තයෙන්ම ප්‍රතිවිරුද්ධ ප්‍රතිපලයක් ගෙනැවිත් තිබේ.

ආන්ඩුවේ පිලිවෙත වෙනස් කිරීමට බලපෑමක් කිරීම වත්මන් දේශපාලන පද්ධතිය තුලින් කල හැක්කක් නොවේ. ඊට මූලික හේතුව මෙම දේශපාලන ආයතන හා පක්ෂ, පන්ති පාලනයේ ඔප නොදැමූ උපකරන

වීමයි. දේශපාලන ජීවිතයේ සෑම අංශයක්ම මත පරම ආධිපත්‍ය දරන්නේ මූල්‍ය ප්‍රභුවයි.

ඔබාමා පරිපාලනය එහි පන්ති ස්වභාවය වසං කිරීමෙහි ලා මඳ හෝ උත්සාහයක් නොදැරීම, සමහරවිට වඩාත්ම සැලකිල්ලට ගත යුතු කාරනයයි. ඔබාමාගේ පුද්ගල ප්‍රතිරූපය ම විරුද්ධත්වය මැඬපැවැත්වීමට සෑහෙන්නේ යයි සිතන බවක් පෙනී යයි. ඩිමොක්‍රටික් පක්ෂය හා එහි පරියන්තය, එනම් "වාම" ප්‍රකාශන හා සංවිධානවලට අයත් කට්ටිය, කෙරෙහි යොමුව ඇති පරිපාලනයේ අවධානයේ තරමට මෙම තක්සේරුව නිවැරදි විය හැකිය.

කෙසේ වෙතත්, ආර්ථිකය හා සෞඛ්‍ය පහසුකම් මත ඇතිව තිබෙන සැලකිය යුතු පිරිහීමත් සමඟ ඔබාමාගේ ජනමත අනුපාතය දැනටමත් කැපී පෙනෙන අයුරු පහත වැටී ඇත. වඩාත් මෑතක දී පැවැත්වූ *වොෂින්ටන් පෝස්ට්* - ඒබීසී ප්‍රවෘත්ති මත විමසුමට අනුව, පලමු වතාවට සමස්තයක් ලෙස ඔබාමාගේ මනාප වර්ගීකරනය සියයට 60 කට වඩා පහත වැටී තිබේ. සැබවින්ම මහජන අතෘප්තිය මෙම සංඛ්‍යාවන් පෙන්නුම් කරනවාට වඩා පුලුල් හා ගැඹුරු බව අපි අනුමාන කරන්නෙමු.

මෙහි දී ලින්කන්ගේ ජනප්‍රිය ආප්තෝපදේශය උපුටා දැක්වීම අවශ්‍යය. "ඔබට එක්තරා කාලයක් යම් තරමක් මිනිසුන් රැවටිය හැකිය, යම් කාලයක් සියලු මිනිසුන් රැවටිය හැකිය, එහෙත් ඔබට සියලු මිනිසුන් සෑම කාලයේම රැවටිය නොහැකිය."

මහජන අතෘප්තිය හා කෝපය, ආර්ථික අර්බුදයේ වෛෂයික බලපෑමෙන් ද, ඔබාමාගේ යුද්ධ වලින් ද, තමාගේ ජයග්‍රහනය සඳහා ඔහු ආයාචනා කල මහජන මනෝභාවයන් හා ඔහු ආරක්ෂා කිරීමට කැපවී සිටින සමාජ අවශ්‍යතාවන් ද අතර එන්ට එන්ටම ගිනියම් වන ප්‍රතිවිරෝධය තුලින් ද ඉදිරියට තල්ලු කරයි. ඇමරිකානු ජනතාව තමන් රැවටීමට හා මෝඩයන් ලෙස සැලකීමට ලක්ව ඇති බව වටහා ගන්නා තාක් දුරට, ජනතා විරෝධය ඉමහත් ලෙස උත්සන්න වනු ඇත.

ඇමරිකානු කම්කරු පන්තියේ ස්වාධීන මැදිහත් වීමක් සමඟ පරිපාලනය තවමත් ඔට්ටුවී නැත. මෙම පන්ති ව්‍යාපාරය වැඩී එන කල එය, සමස්ත දේශපාලන හා සමාජ පද්ධතියට ම එරෙහිව හා ඉන් ස්වාධීන නව මාවත් වලට යොමු වනු ඇත.

**ජෝ කිෂෝර්**

© www.wsws.org